# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி,வதிவிடப் பொருளாதார,நுண்நிதிய,சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது<br>My No | DSD/HO/6/EP/02/ACP/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | .............................................. | දිනය<br>திகதி<br>Date | 2022.02.21 |
|---|---|---|---|---|---|

***සමෘද්ධි දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2022 / 03***

සියළුම දිස්ත්‍රික්ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශිය ලේකම් වරුන් ,

සියළුම මූලස්ථාන, බැංකු සමිති, ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්,

සියළුම සංවර්ධන නිලධාරීන්,

සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**<u>සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන - 2022</u>**

අඩු ආදායම්ලාභින්ගේ ජීවන තත්ත්වය තිරසාර ලෙස වර්ධනය කිරිම තුළින් දිවයිනේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරිම උදෙසා "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහනට සමගාමීව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - 2022 සැලසුම් කර ඇත. ඒ අනුව පහත වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් හඳුනාගැනීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

ව්‍යවසාය සංවර්ධන වැඩසටහන -2022 මගින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

1. අලෙවි මධ්‍යස්ථාන,අලෙවි පොලවල් හා සමෘද්ධි සුව බොජුන්හල් සංවර්ධනය කිරිම, අළුත්වැඩියා කිරීම සහ වැඩි දියුණු කිරීම
2. දුම්රිය ස්ථානයන් තුළ සමෘද්ධි අලෙවිසැල් ආරම්භ කිරීම.
3. වස විස රහිත ආහාර සැකසුම සඳහා කාන්තාවන් පුහුණු කිරීම
4. දේශීය ශාක සාර නිෂ්පාදන ඇසුරින් රූපලාවන්‍ය සඳහා පුහුණුව
5. අන්තර්ජාලය හරහා භාණ්ඩ අලෙවිය.(Online marketing)
6. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන
7. සමෘද්ධි වෙළඳ ජාලය ශක්තිමත් කිරිම
8. සමෘද්ධි නිෂ්පාන සඳහා තත්ත්ව හා ප්‍රමිති සහතික ලබා ගැනිම
9. "සමෘද්ධි අභිමානී 2022"වෙළඳ ප්‍රදර්ශන පැවැත්විම.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |

1. **අලෙවි මධ්‍යස්ථාන,අලෙවි පොලවල් හා සමෘද්ධි සුව බොජුන්හල් සංවර්ධනය කිරිම, අළුත්වැඩියා කිරීම සහ වැඩි දියුණු කිරීම.**

2022 වසරේදි නව සුව බොජුන්හල් සහ අලෙවි මධ්‍යස්ථාන ඉදි කිරිම සඳහා ප්‍රතිපාදන ලබා නොදේ. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පාලනය හා අයිතිය ඇති සති පොලවල්, අලෙවි මධ්‍යස්ථාන සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන අතර දැනටමත් ඉදිකර ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන සුව බොජුන්හල් සහ අලෙවි මධ්‍යස්ථානවල මෙන්ම පසුගිය වසරේ ප්‍රතිපාදන වලින් වැඩ අවසන් කර මෙම වසරේ මුල් කාර්තුවේදී ව්‍යාපාර කටයුතු ආරම්භ කිරිමට යෝජිත මධ්‍යස්ථාන සඳහා ද මෙම වැඩසටහන ක්‍රියාත්මකය. මේ සඳහා අනුමත කරන ලද ඇස්තමෙන්තුවක් යොමු කළ යුතු අතර අලෙවි මධ්‍යස්ථානයක් හෝ අලෙවි පොලක් නම් ඒ සමග ව්‍යාපෘති වාර්තාවක් ද යොමු කළ යුතුය.

2. **දුම්රිය ස්ථාන තුළ සමෘද්ධි අලෙවිසැල් ආරම්භ කිරීම**

සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ අඩු ආදායම්ලාභින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොලක් ඇති කිරිම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙම වසරේදී දුම්රිය ස්ථාන 20 ක් තුළ අලෙවිසැල් ආරම්භ කිරිමට සැලසුම් කර ඇත. ඔබ දිස්ත්‍රික්කය තුළ ඇති දුම්රිය ස්ථානවල අලෙවි මධ්‍යස්ථාන ආරම්භ කිරිමට ඇති හැකියාව පිළිබඳ පරීක්ෂා කර අලෙවි අංශය වෙත යොමු කළ යුතුය.

3. **වස විස රහිත ආහාර සැකසුම සඳහා කාන්තාවන් පුහුණු කිරීම**

තවමත් පුහුණුව ලබාගෙන නොමැති, සමෘද්ධි සුව බොජුන්හල්වල ව්‍යාපාර කටයුතු සිදුකිරිමට බලාපොරොත්තුවන කාන්තාවන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන අතර සමෘද්ධි වැඩසටහනින් ප්‍රතිලාභ ලබා පුද්ගලික භෝජනාගාර පවත්වාගෙන යනු ලබන කාන්තාවන් සඳහා ද පුහුණුව ලබා දෙනු ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය මගින් ලබාදෙන මෙම පුහුණුව සඳහා එකවර කාන්තාවන් 20 – 40 අතර ප්‍රමාණයක් සහභාගි කර ගත හැක. එම දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය මගින් ලබාදෙන ඇස්තමේන්තුව යොමු කිරීමෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

4. **දේශිය ශාඛ සාර නිෂ්පාදන ඇසුරින් රූපලාවන්‍ය සඳහා පුහුණුව**

"රුව හැඩකරන දැතට සවියක්" තේමාව යටතේ දේශිය ශාඛ සාර නිෂ්පාදන ඇසුරින් රූපලාවන්‍ය කර්මාන්තය දියුණු කිරිම සඳහා ශිල්පින් පුහුණු කිරීම. සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ අඩු ආදායම්ලාභි පවුල්වල සමාජිකයන් අතුරින් මෙම කර්මාන්තය සඳහා උනන්දුවක් දක්වන අය සහභාගී කරගත හැකි අතර, වැඩ සටහන් 14 ක් ක්‍රියාත්මක කිරිමට නියමිතය. ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ඉදිරියේදී දැනුම්දෙනු ඇත.

5. **අන්තර්ජාලය හරහා භාණ්ඩ අලෙවිය.(Online marketing)**

සමෘද්ධි නිෂ්පාදකයන්ගේ භාණ්ඩ සඳහා වෙළඳපොල අවස්ථාව පුළුල් කිරිමේ අපේක්ෂාවෙන් මෙය ක්‍රියාත්මකය. දැනටමත් අන්තර්ජාල වෙළඳ ආයතන වන Darazz.lk හා Onawedak.lk සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇති අතර තවත් ආයතන සමග සම්බන්ධ වීමට සැලසුම් කර ඇත. ඔබ දිස්ත්‍රික්කය තුළ සිටින සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ නිෂ්පාදකයින්, සේවා සපයන්නන් හා නිෂ්පාදන ගම්මාන පිළිබඳව තොරතුරු සුදානම්කර තබාගත යුතුය

## 6. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

YouLead ආයතනය හා එක්ව ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන මුල් අදියරේදී පහතින් දක්වා ඇති දිස්ත්‍රික්ක අට තුල ක්‍රියාත්මකය. එහිදී සෑම ග්‍රාම නිලධාරි වසමකින්ම, දැනට ව්‍යාපාර කටයුතු සිදුකරන සමෘද්ධි ව්‍යවසායකයින් තිදෙනා බැගින් වනසේ තෝරා ගන්නා අතර 13,647 දෙනෙකු පුහුණු කිරිමට සැලසුම් කර ඇත.
වැඩසටහන ක්‍රියාත්මක දිස්ත්‍රික්ක - මාතර,හම්බන්තොට, මොනරාගල, අම්පාර, කුරුණෑගල, අනුරාධපුරය, කිලිනොච්චිය, වවුනියාව

## 7. සමෘද්ධි වෙළඳ ජාලය ශක්තිමත් කිරිම

2021 වසරේදී ග්‍රාම නිලධාරි වසම් මට්ටම, ප්‍රජා මුල බැංකු මට්ටම හා ප්‍රජාමුල බැංකු සමිති මට්ටමින් තෝරා ගන්නා ලද අලෙවිසැල් 120 ක් මුල් අදියර යටතේ ආදර්ශ වෙළඳසැල් ලෙස ශක්තිමත් කිරිමට සැලසුම් කර ඇත. මේ පිළිබඳව උපදෙස් ඉදිරියේදී ඔබ වෙත ලබාදෙනු ඇත.

## 8. සමෘද්ධි නිෂ්පාදන සහ සේවා සඳහා තත්ත්ව හා ප්‍රමිති සහතික ලබා ගැනිම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා එක්ව සමෘද්ධි ව්‍යාපාරිකයන්ගේ නිෂ්පාදිත හා සේවා සඳහා තත්ත්ව හා ප්‍රමිති සහතික ලබාදිමට සැලසුම් කර ඇත. මේ පිළිබඳව දැණුවත්කිරිම් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග එක්ව සිදුකිරිමට කටයුතු යොදා ඇති අතර ඔබ දිස්ත්‍රික්කයේ සමෘද්ධි නිෂ්පාදන හා සේවා සපයන්නන් පිළිබඳව තොරතුරු රැස්කර තබාගැනිම ඉදිරි කටයුතු පහසු වනු ඇත.

## 09. "සමෘද්ධි අභිමානී 2022"වෙළඳ ප්‍රදර්ශන පැවැත්විම.

පෙර වර්ෂ වල මෙන්, සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම මෙන්ම අලෙවි අවස්ථා පුළුල් කරලීම මෙහි අරමුණයි. ඒ අනුව **සමෘද්ධි බැකු සමිති මට්ටමින්** සංවිධානය කළ යුතු අතර, අප්‍රේල් මාසයේ 7 – 10 දක්වා ඕනෑම දින දෙකක් තුළ සිංහල හා හින්දු අළුත් අවුරුද්ද මුල් කරගෙන පවත්වා අවසන් කළ යුතුය. එසේම තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක දිස්ත්‍රික් ප්‍රදර්ශන පැවැත්විමට ද සංවිධානය කර ඇති අතර වෙළඳ ප්‍රදර්ශන පවත්වන ආකාරය පිළිබඳව මූලික උපදෙස් ඉදිරියේදී ඔබ වෙත ලබාදෙනු ඇත.

<u>**පොදු උපදෙස්**</u>

01. ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රජාවට ගැලපෙන ආකාරයට මෙන්ම ව්‍යවසායකයාගේ ව්‍යාපාරයේ තිරසාර බව තහවුරු වන ආකාරයට ප්‍රතිලාභීන් තෝරා ගැනීම කළ යුතු අතර ඔහු /ඇය ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකයෙකු බවට තහවුරුවක් ලබාගත යුතුය.
02. ව්‍යාපෘති සඳහා වන සියළු මිලදී ගැනීම් හා අනෙකුත් සියළු කටයුතු රජයේ මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලීන්ට අනුකූලව සිදු කළ යුතු බව අවධාරණය කෙරෙන අතර අදාල ආයතන හා දෙපාර්තමේන්තු නිර්දේශිත මිල ගණන් සැලකිල්ලට ගෙන ගෙවීම් කිරීමටද වගබලා ගත යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම් වලට එළඹීමෙන් පසුව මුදල් නිදහස් කිරීමට පියවර ගැනිම වඩාත් සුදුසු වේ.
03. ඉදිකිරීම් වලට අදාළව ආරම්භ කරනු ලබන ව්‍යාපෘති සියල්ල මෙම මුදල් වර්ෂය තුළ නිමවා අවසන් කළ යුතු අතර කිසිදු විටෙක ව්‍යාපෘති අවිච්ඡේද නොකළ යුතුය.

04. ව්‍යාපෘති අධීක්ෂණය, පසු විපරම් ක්‍රියාවලිය මෙන්ම ප්‍රගති සමාලෝචනයද, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගම් මට්ටමින් හා බැංකු සමිති මට්ටමින් සිදුවිය යුතු අතර ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසා ගත යුතුය.

05. භාණ්ඩාගාර සෘජු ප්‍රතිපාදන යටතේ කේවල ව්‍යාපෘති සඳහා අනුමත කරන මුදල් නැවත අය කිරීමක් නොකෙරේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එකී ව්‍යාපෘති සඳහා සත්‍ය වශයෙන්ම දරන වියදමට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 0.5% ක් ද ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා 2%ක් ද වන සේ පරිපාලන වියදම් වෙන් කරනු ලැබේ.

06. ප්‍රාදේශීය මට්ටමෙන් හඳුනාගන්නා ලද ව්‍යාපෘති යෝජනා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයෙන් දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතුය.

07. දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ව්‍යාපෘති සඳහා අලෙවි අංශය වෙත ඉදිරිපත් කොට ප්‍රතිපාදන ලබා ගත යුතුය.

08. සෑම මසකම අවසන් දිනට සකස් කරන ලද මාසික ප්‍රගති වාර්තාව ඇමුණුම් අංක 6-i,6-ii හා 6-iii ට අනුවඑළඹෙන මස 10 වන දිනට පෙර අධ්‍යක්ෂ (අලෙවි) වෙත ලැබීමට සැලැස්විය යුතුය.

09. ව්‍යාපෘතිවලට අදාල ප්‍රදර්ශන නාම පුවරු සමෘද්ධි හා රාජ්‍ය ලාංඡන සහිතව අනුමත වර්ණයන් යොදා සකස් කළ යුතුය.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම් ,සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය -කා.දැ.ගැ.පි
02. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(සවිබලගැන්වීම්) -කා.දැ.ගැ.පි
03. ප්‍රධාන ගණකාධිකාරී -කා.දැ.ගැ.පි
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක -කා.දැ.ගැ.පි
05. සියළුම අංශ ප්‍රධානීන් -කා.දැ.ගැ.පි